ඒකාබද්ධ සේවා චක්‍රලේඛ. 01/2005

මගේ අංකය :- PA/CS/MAS
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ - 07.
2005.02.25

සියලුම අමාත්‍යාංශ ලේකම් වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිසාපති/දිස්ත්‍රික් ලේකම් වරුන්/ප්‍රාදේශීය ලේකම් වරුන්,
සහ රාජ්‍ය ආයතන ප්‍රධානීන් වෙත.

## රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය ක්‍රියාත්මක වීම

යථෝක්ත කාරණය සම්බන්ධයෙන් නිකුත් කරන ලද අංක: 10/2004 සහ 2004.12.30 දනම දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට වැඩිමනත් වශයෙනි.

02 අංක 1372/23 - 2004.12.24 දනම දරණ රජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සහ උක්ත චක්‍රලේඛය අනුව පහත දක්වෙන සේවාවන් හා එම සේවාවන් වලට අදාල ව්‍යවස්ථා සංග්‍රහයන් 2005.03.23 දිනෙන් පසුව මුළුමනින්ම අහෝසි වේ.

1. සාමාන්‍ය ලිපිකාර සේවය
2. රජයේ යතුරුලේඛක සේවය
3. රජයේ ලඝුලේඛක සේවය
4. රජයේ පොත් තබන්නා සේවය
5. රජයේ සරප් සේවය සහ
6. රජයේ ගබඩා භාරකාර සේවය

03 මේ අනුව ව්‍යවස්ථා සංග්‍රහයේ 14:1 ඡේදය සහ xiii වන පරිශිෂ්ඨය ප්‍රකාරව 2005.03.23 වන දින හෝ ඊට පෙර විධිමත් ලෙස රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාප ප්‍රකාශ පත්‍රයක් ඉදිරිපත් කර ඇති නිලධරයන් හැර අනෙකුත් සියලුම නිලධරයන්ගේ සේවය 2005.03.23 දිනෙන් පසු අහෝසි වේ. තව ද මනාපය පළ කිරීමේ අවසන් දිනයට පෙර කටයුතු කල හැකි වන පරිදි රාජ්‍ය පරිපාලන අංක 10/2004 චක්‍රලේඛයේ විධිවිධාන පිළිබඳව සියළුම නිලධරයන් දැනුවත් කිරීමට අදාල බලධරයන් වගබලා ගත යුතුය.

04. එක් නිලධාරියකුට ඉදිරිපත් කළහැක්කේ එක් මනාප ප්‍රකාශ පත්‍රයක් පමණි. දෙපාර්තමේන්තු ප්‍රධානියකු මගින් මෙම අමාත්‍යාංශයට ඉදිරිපත් කල මනාප ප්‍රකාශ පත්‍රයක් ඉල්ලා අස්කරගෙන ඒ වෙනුවට වෙනත් මනාප ප්‍රකාශ පත්‍රයක් ඉදිරිපත් කිරීමට කිසිවෙකුට ඉඩ දෙනු නොලැබේ. දැනටමත් ඒ අනුව එකම පුද්ගලයෙකුට දෙවන මනාප ප්‍රකාශ පත්‍රයක් ඉදිරිපත් කරන ලද දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත්නම් පළමුව ඉදිරිපත් කළ මනාප ප්‍රකාශයේ මනාපය ක්‍රියාත්මක වන බවට සෑහීමකට පත් විය යුතු අතර, දෙවනුව ඉදිරිපත් කළ මනාප ප්‍රකාශ පත්‍රය පිළිබඳව මා දැනුවත් කර මා වෙතින් ඉවත් කර ගත යුතු වේ.

05.(අ). ඉහත චක්‍රලේඛය යටතේ විශ්‍රාම ගැන්වීමට මනාපය පළ කල නිලධාරීන්ට 2005.03.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ස්ථාන මාරු නියෝග දී ඇත්නම් ඒවා අවලංගු කලා සේ සැලකිය යුතුය. විශ්‍රාම ගැන්වීමට මනාපය පළ කල නිලධාරීන්ට විශ්‍රාම ගැන්වීම අනුමත කල ලිපියක් නිකුත් කරන අතර ඔවුන්ට 2005.03.23 දින තෙක් මනාප ප්‍රකාශ පත්‍රය ඉදිරිපත් කල කාර්යාලයේ සේවය කිරීමට ඉඩ ලැබෙන අතර එම කාර්යාලයෙන්ම විශ්‍රාම ගැන්විය යුතුය.

**05.(ආ).** කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කල නිලධරයන් සම්බන්ධයෙන් නිකුත් කර ඇති ස්ථාන මාරු නියෝග එපරිද්දෙන්ම ක්‍රියාත්මක විය යුතුය.

**06** රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට පත්වන නිලධාරීන්ට ඔවුන් මෙතෙක් කර ගෙන ආ කාර්යයන් හා විෂයයන්ට අමතරව වෙනත් කාර්යයන් හා වැඩ විෂයයන් පිළිබඳව කාර්ය ස්ථාන පුහුණුවක් ලබා දීමට කටයුතු කල යුතු වේ. ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා විෂය ප්‍රවීනයන්ගේ සහාය ඇතිවද, නිලධාරීන් කණ්ඩායම් ලෙස විවිධ විෂය කටයුතු වල යෙදීමට ඉඩ සැලසීමෙන්ද ඒ සඳහා පහසුකම් සලසා ගත හැක. ඉදිරියේදී නිලධාරීන්ට තමන් ප්‍රිය මනාප කරණ/පහසු සේවා ස්ථානයකට හෝ විෂයකට මාරුවීම වැනි අවස්ථාවලදී එය ප්‍රමුඛත්වය ලැබීමට හේතු වනු ඇත. නිලධාරීන් විවිධ විෂය/කාර්යයන් පුහුණුවේදී ඔවුන්ගේ සහජ හැකියාවන් හා නිර්මාණශීලී ක්‍රියාකාරකම් තුලින් සේවය තුල ඉහලම ස්වයං වටිනාකමක් හිමිකරගනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**07** **2005.03.01** වන දින සිට **2005.03.31** දින දක්වා ස්ථාන මාරුවීම් සම්බන්ධ නියෝග නිකුත් කිරීම අත්හිටවනු ලැබේ. **2005.04.01** වන දින සිට ස්ථාන මාරුවීම් පිළිබඳව කටයුතු කිරීමේදී (ආයතන සංග්‍රහයේ iii පරිච්ඡේදයේ දැක්වෙන වාර්ෂික මාරුවීම් නොවන අවස්ථාවලදී) පහත දැක්වෙන පියවර අනුගමනය කල යුතුය.

(අ) සෑම ඉල්ලුම් පත්‍රයක්ම තමන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය, අත්සන සහ නිලමුද්‍රාව ඇතිව ඉදිරිපත් කිරීම.(නිර්දේශ කිරීමේදී අනුප්‍රාප්තිකයකු සහිතව / රහිතව නිදහස් කල හැකිදැයි දැක්විය යුතුය)

(ආ) කිසියම් සේවා ස්ථානයකට ස්ථාන මාරුවීමක් ඉල්ලා සිටින නිලධරයකු එහි පවත්නා පුරප්පාඩුවට අදාල විෂයය / කාර්යන් ඉටු කිරීමට එකඟතාවය පල කල යුතුය.

(ඇ) කිසියම් සේවා ස්ථානයක පුරප්පාඩු පවතින බව වාර්තා කරන විට එහි පවත්නා පුරප්පාඩු වල පවතින විෂයය / කාර්යයන් මොනවාද යන්න සටහන් කිරීම

(ඈ) සුහද ස්ථාන මාරුවීම් ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී ද පවරන විෂයය / කාර්යයන් ඉටු කිරීමේ එකඟතාවයට යටත්ව දෙපාර්තමේන්තු ප්‍රධානයන් මඟින් අයදුම්පත් ඉදිරිපත් කල යුතු වේ.

**08** **2004.03.24** වන දිනට එක් එක් දෙපාර්තමේන්තුවේ යටත් නිලධාරීන් සම්බන්ධයෙන් මේ සමඟ එවන "ඇ" ආකෘතියට අදාල වාර්තාවක් සකස් කර එම වාර්තාව **2005.04.10** දිනට පෙර ලැබෙන සේ මා වෙත එවන්න. රජයේ ඒකාබද්ධ අරමුදලෙන් වැටුප් ලබන නිලධාරීන් සම්බන්ධයෙන් පමණක් තොරතුරු එහි ඇතුලත් විය යුතු වේ.

ජයම්පති පී.හෙට්ටිආරච්චි
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:

| | | |
|---|---|---|
| 1. | අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව | තනතුරු නාම සහ සේවාවන් වෙනස්වීම පිළිබඳව දැනගැනීම සඳහා |
| 2. | ආයතන අධ්‍යක්ෂ ජනරාල් | |
| 3. | විගණකාධිපති | |
| 4. | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ | |

## යටත් නිලධාරී ශ්‍රේණිය

"ඇ" ආකෘතිය

දෙපාර්තමේන්තුව:

වැටුප් ගෙවන වැය ශීර්ෂය:

අනුමත කාර්යය මණ්ඩලය.

| | | අධිපන්තිය | I පන්තිය | II පන්තිය | III පන්තිය |
|---|---|---|---|---|---|
| 1 | **2005.03.23** වන දින සිට රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පල කල සංඛ්‍යාව | | | | |
| 2 | විශ්‍රාම යාමට මනාපය පල කල සංඛ්‍යාව | | | | |
| 3 | මනාප ප්‍රකාශ පත් ඉදිරිපත් නොකල සංඛ්‍යාව | | | | |
| 4 | පුරප්පාඩු සංඛ්‍යාව | | | | |
| 5 | ලිපිකරු සහ සමාන්තර සේවා වලට අයත් වැටුප් ගෙවන වෙනත් නිලධාරීන් සිටිනම් (පලාත් සභා නිලධාරීන් හෝ වෙනත්) | | | | |
| | එකතුව | | | | |

දිනය:

අත්සන:

නම:

නිල නාමය:

නිල මුද්‍රාව: